හම්බන්තොට ප්‍රාදේශීය සභා - 06 වන සභා වාරයේ 58 වන මහා සභා රැස්වීම් වාර්තාව

## 2023.02.06 දින පැවති මහ සභා රැස්වීම වාර්තාව

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. | ගාමිණී සමරගුණරත්න මහතා | ගරු සභාපති |
| 2. | ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා | ගරු උප සභාපති |
| 3. | එස්.ඒ. නිහාල් ශාන්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. | ජේ.ආර්. දිසානායක සිරිපාල මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. | එච්.එස්. ප්‍රදීප් නිශාන්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. | හසිනි ඉමල්කා මදූෂානි රත්නවීර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. | එච්.ජී. නිහාල් චන්දන මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. | එස්.කේ. උපුල් සංජය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. | එස්.වී.පී. ජනිත් චමීර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. | ඒ.ජී. නිලූකා දිශානි මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. | එස්.කේ. කුමුදුනී මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. | කේ.ඩබ්. සුමිත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 1. | ජේ.ඒ. කසුන් තිලංජන මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 2. | එම්. ඒ. චන්ද්‍රදාස මුණසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, |

**ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා**

06 වන සභා වාරයේ 58 වන මහ සභා රැස්වීමට සහභාගී වීම සඳහා පැමිණ සිටින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලූ දෙනා ගෞරවයෙන් හා සාදරයෙන් පිළිගන්නා ලදී.

**01. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**1.1 ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා**

පසුගිය 2023.01.04 වන දින පැවති මහා සභා රැස්වීම වාර්තාව සම්මත කිරීමේ අවස්ථාව බවත්, මේ වන විට සංශෝධන ලබාදී ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන් අමතා ප්‍රකාශ කරන ලදී.

**1.1.1 ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා**

2023.01.04 දින පවත්වන ලද මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරන ලදී.

එම වාර්තාව සංශෝධනයන්ට යටත්ව ගරු මන්ත්‍රී එච්.එස්. ප්‍රදීප් නිශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව 2023.01.04 දින මහා සභා රැස්වීම වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**2. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -නැත**

**2.1. ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා.**

2.1.1 දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක Cma/01/08 හා 2023.01.30 දිනැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපල අවභාවිතා කිරීම ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. එමගින් පළාත් පාලන ආයතන 340 ක් සඳහා නා යෝජනා ප්‍රසිද්ධ කරන ලද 2023.01.04 දින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අව වන තෙක් කාල සීමාව ඡන්ද විමසීමේ කාල සීමාව ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, එම කාල සීමා තුළ සභාපතිතුමා හෝ සභිකයන් විසින් සභාවේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලය මැතිවරණ කටයු ප්‍රවර්ධනය වන කාර්යන්ට සම්බන්ධ කර නොගන්නා ලෙසත්, සභාවට නීත්‍යානුකූලව පැවරී ඇ රාජකාරි ඉටු කිරීමේදී අපක්ෂපාතීව සාමාන්‍ය පරිදි සිදු කළයුතු බවත්, සභාපතිතුමාගේ නිල රථය ඇතු සභාවේ කිසිදු වාහනයක් හෝ දේපලක් මැතිවරණ ප්‍රචාරක කාර්යන් සඳහා යොදා නොගන්නා ලෙස විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවට ප්‍රතිපාදන සලස්වා ඇති වියද සම්බන්ධයෙන් මේ වන විට පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවත්, රැස්වී හා වෙනත් කටයුතු සඳහා බදු දෙන සභාවේ ගොඩනැගිලි හා භූමි සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතු ලිපි ලේඛන පවත්වාගෙන යා යුතු බවත්, එසේම ආයතනයේ සැලසුම් කරන විවෘත කිරීම හෝ වෙනත් උත්සව පවතින්නේ නම් ඒ සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන විනිවිද භාවයෙන් යුතුව කටයුතු කළ යුතු බවත් නිවේදනය කරන ලදී.

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන -ඈත.**

3.1 දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1/10/02 හා 2023.01.10 දිනැති පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා පිළියම් යෙදීම යන ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

**ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා.**

දකුණු පළාතේ පළාත් පාලන ආයතන යටතේ පවත්වාගෙන යන පෙර පාසල් හා පුස්තකාල වල සේවය කරන පෙර පාසල් ගුරුවරු හා පුස්තකාල සහායක කාර්ය මණ්ඩලයේ කොටසක් රජයේ ස්ථිර පත්වීම් ලාභීන් වන අතර, කොටසක් අනියම්, ආදේශක හෝ දෛනික වැනි ස්ථිර නොවන තනතුරුවල සේවය කරමින් සිටින අතර, වර්තමානයේ බල පැවැත්වෙන රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය සේවය සඳහා පත්වීම් ලබාදීමක් සිදු නොවන බැවින් ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ කොටසක් විශ්‍රාම යාම හේතුවෙන් ඇතිවන පුරප්පාඩු සඳහා අළුතින් කාර්ය මණ්ඩලය යෙදවීම ගැටළු සහගත බැවින් පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක නිලධාරීන් විශ්‍රාම යාමට මාස 06 කට ප්‍රථම ඒ සඳහා පෙර සූදානම් සැලැස්මක් සකස් කර සභාවේ අතිරික්ත සේවකයින් යොදවා පුරප්පාඩු තුලනය කර ගන්නා ලෙසත්, සභාවේ ආදායම් තත්ත්වය සලකා බලා අත්‍යවශ්‍යම පෙර පාසල් ගුරු හා පුස්තකාල තනතුරු කිහිපයක් පමණක් සභා අරමුදලින් වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගන්නා ලෙසත්, ඉහත පරිදි කටයුතු කිරීමට අවස්ථාවක් නොමැති විටකදී පුරප්පාඩු වූ පෙර පාසල හෝ ශාඛා පුස්තකාලය වසා දමා එහි තිබෙන සම්පත් ආසන්නයේ ඇති සභාව සතු වෙනත් පෙර පාසලකට හෝ පුස්තකාලයකට සම්බන්ධ කිරීම සුදුසු බවත් දන්වා ඇත. එහෙත් හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් හෝ පුස්තකාල වල ආසන්නයේ විශ්‍රාම යන නිසිදු නිලධාරියෙකු නොමැති බැවින් මෙම ලිපිය ගැටළුවක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

3.2 දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CMA/01/08 හා 2023.02.02 දිනැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම -2023 පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපල අවභාවිතා කිරීම යන ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා.

පළාත් පාලන ආයතන වෙත අදාළ අදාළ ව්‍යවස්ථාපිත පනත් මගින් පැවරී ඇති කාර්යන් හා කර්තව්‍ය ඉටු කිරීමේදී මේ වන විට ප්‍රකාශයට පත්කර ඇති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම බාධාවක් කර නොගත යුතු බව පෙන්වා දෙන අතර, පළාත් පාලන ආයතනවල වියදම් සීමා කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමුවී ඇති බැවින් ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 කෙරෙහි අවධානය යොමු කරන ලෙසත්, වැය අනුමැතියේදී ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

3.3 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂගේ අංක NVTIM/TR/OJT/2-2 හා 2023.01.23 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ පූර්ණ කාලීන පරිගණක ආධාංග ශිල්පී පාඨමාලාව ඩබ්.ජී.කේ.එම්. භාෂිත යන ආධුනික පුහුණුකරු විසින් හදාරා ඇති බැවින් එම සිසුවා මාස 06 ක කාල සීමාවක් සඳහා පුහුණු පදනමින් දිනකට රු. 500.00 ක දීමනාවක් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලද අතර, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

3.4 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිසාපතිතුමාගේ අංක DSH/DAD/02/01/10 හා 2022.12.09 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා.

හම්බන්තොට ප්‍රාදේශීය සභාව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙතින් කරන ලද ඉල්ලීම අනුව ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මයුරපුර සති පොළ භූමිය තුළ ඉදිකර ඇති මෙට්‍රික් ටොන් 50 ක ධාරිතාවය සහිත මීටර් 10×07 විශාලත්වයෙන් යුතු ගබඩාවේ වැඩ අවසන් කර ඇති බැවින් එය විධිමත්ව භාර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.

3.5 ගම සමඟ පිළිසඳරක් වැඩසටහන අනුව ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙ වැඩසටහන -2021 මයුරපුර සතිපොළ වාහන නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීම සම්බන්ධයෙන් විෂය නිළධාරිණිය විසින් ලබාදී ඇති 2023.01.03 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා.

ගම සමඟ පිළිසඳරක් වැඩසටහන අනුව ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන -2021 මයුරපුර සතිපොළ වාහන නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021.09.09 දින ගිවිසුම අත්සන් කරන ලද අතර, ගිවිසුම ප්‍රකාරව 2021.12.07 දින කොන්ත්‍රාක් කාල සීමාව අවසන් වී ඇති අතර. ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව එම දිනට ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකිරීම හේතුවෙන් 2022.12.16 දින

පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 8.1.1 අනුව ගිවිසුම අවලංගු කිරීම සඳහා තීරණය කර ඇති බැ
දෙපාර්ශවයේ එකඟතාවය මත 2023.01.03 දින ගිවිසුම අවලංගු කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.

5. යථා පරිදි කල් දී ඇති යෝජනා- ඇත

5.1. ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා

5.1.1 හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ සැළසුම් දින ඇතුළත් සැලැස්ම සභා සම්මත වි
යයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

| මාසය | දිනයන් |
|---|---|
| ජනවාරි | 17,30 |
| පෙබරවාරි | 15,28 |
| මාර්තු | 15,30 |
| අප්‍රේල් | 17,28 |
| මැයි | 12,31 |
| ජූනි | 15,30 |
| ජූලි | 14,31 |
| අගෝස්තු | 15,31 |
| සැප්තැම්බර් | 15,27 |
| ඔක්තෝම්බර් | 15,30 |
| නොවැම්බර් | 15,30 |
| දෙසැම්බර් | 15,29 |

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා

5.1.2. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව සකස් කර තිබූ පුරවැසි ප්‍රඥප්තිය සංශෝධනය
කර 2023 වර්ෂයේ සිට ඉදිරියට පවත්වාගෙන යාමට සකස් කරන ලද හම්බන්තොට ප්‍රාදේශීය සභ
පුරවැසි ප්‍රඥප්තිය සභා සම්මත වියයුතු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

CamScanner

ආයතනයේ නම - හම්බන්තොට ප්‍රාදේශීය සභාව

අපගේ දැක්ම -සෞභාග්‍යයේ යෝධ දනව්වක් අදිටනින් ගොඩනැගීම.

අපගේ මෙහෙවර - ඓතිහාසික රෝහණ රාජධානියේ මාගම්පත්තුවේ අභිමානවත් රණකාමී රෙරපුත්තාභය, ගෝඨයිම්බර, නිලමහා වැනි යෝධයන්ගෙන් ජීවන ආයාද ලත් පෞරාණික සංස්කෘතියෙන් බිහිවූ කෘෂි ආර්ථිකයෙන් සහ සොබා දහමින් පෝෂණය වන හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සුව විහරණය හා සුභ සාධනය සඳහා සභාව සතු මානව හා භෞතික සම්පත් ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් තිරසර සංවර්ධනයක් කරා පිවිසීමයි.

## පළාත් පාලන් ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය

| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා | වෙනත් නිලධාරීන් | කාර්ය නිම කිරීමට ගත අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 01. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 03 (ඉල්ලීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකිය)<br>4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රාදේශවලට පමණක් අදාළ වේ.<br>5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>6. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>7. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්<br>8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතුය | පෙරටු කාර්යාල නිලධාරි | 1. තාක්ෂණ නිලධාරි<br>2. විෂය භාර නිලධාරි | දින 14 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 750 /=<br>ගෙබිමේ ප්‍රමාණය ව.මී. 400 දක්වා තනි පුද්ගල ව.මී.කට රු.20/= ක් ද මහල් නිවාසයකට රු. 25/= ක් ද නේවාසික නොවන ව.මී.කට රු.25/= ක් ද වේ.<br>ගෙබිමේ ප්‍රමාණය ව.මී 401-1000 දක්වා තනි පුද්ගල ව.මී.කට රු. 22/= ක් ද මහල් නිවාසයකට රු.27 /= ක් ද නේවාසික නොවන ව.මී.කට රු. 27/= ක්ද වේ.<br>ගෙබිමේ ප්‍රමාණය ව.මී. 100 1-1500 දක්වා තනි පුද්ගල ව.මී.කට රු.25/= ක්ද,මහල් නිවාසයකට රු.30/= ක්ද නේවාසික නොවන ව.මී කට රු.30/= ක්ද වේ.<br>ගෙබිමේ ප්‍රමාණය ව.මී 1501-2000 දක්වා තනි පුද්ගල ව.මීකට රු.25/= ක් ද මහල් නිවාසයකට ව.මී.කට රු.32/= ක්ද නේවාසික නොවන ව.මීකට රු.32/= ක් ද වේ.<br>ගෙබිමේ ප්‍රමාණය ව.මී.2000 ට වඩා වැඩි තනි පුද්ගල මහල් නිවාස හා නේවාසික සඳහා වැඩි වන සෑම ව.මීටර 90 සඳහාම රු.2000/=බැගින් ද වේ. |

| | ලබා දෙනා සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා | වෙනත් නිලධාරීන් | කාර්ය නිම කිරීමට ගත අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 02. | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවර්ධන සැලසුම් අනුමත කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය | පෙරවු කාර්යාල නිලධාරි | 1. තාක්ෂණ නිලධාරි<br>2. විෂය භාර නිලධාරි | දින 14 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 750 /= |
| | | 2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක් | | | | පෙරසැරි ගාස්තුව<br>ව.මී. 150 - ව.මී 300 කැබලි 1 ක් සඳහා රු.1000/=<br>ව.මී.301 - ව.මී.600 කැබලි 1 ක් සඳහා රු.800/=<br>ව.මී. 601- ව.මී 900 කැබලි 1 ක් සඳහාරු.600/=<br>ව.මී.900ට වැඩි කැබලි 1 ක් සඳහා රු500/= |
| | | 3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 03 (ඉල්ලීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරවු කාර්යාලයෙන් දැන ගැනීමට හැකිය) | | | | |
| | | 4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රාදේශවලට පමණක් අදාළ වේ. | | | | |
| | | සංවර්ධනයේ ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබා සහතික | | | | |
| | | 4. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | | | | |
| | | 7. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක් | | | | |
| | | 8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතුය | | | | |
| 03. | සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | පෙරවු කාර්යාල නිලධාරි | 1.තාක්ෂණ නිලධාරි | දින 14 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 750 /= |
| | | 2.අනුමත කළ සංවර්ධන සැලැස්මේ මුල් පිටපත | | 2.විෂය භාර නිලධාරි | | ව.මී 1000 දක්වා රු.5000/= |
| | | 3. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | | | | ව.මී. 1000 ට වැඩි රු.10000/= |

පළාත් පාලන් ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය

| ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා | වෙනත් නිලධාරීන් | කාර්ය නිම කිරීමට ගත අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|
| අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය දීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය | පෙරටු කාර්යාල නිලධාරි | 1. තාක්ෂණ නිලධාරි<br>2. විෂය භාර නිලධාරි | දින 14 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු 750 /= |
| | 2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක් | | | | පෙරසැරි ගාස්තුව<br>ඉදිකිරීම් අදියර අත්තිවාරම වැඩ පමනක් සම්පූර්ණ කොට ඇති විට නේවාසික ව.මී.1ක් සඳහා රු.200/= ක්ද නේවාසික නොවන ව.මී. 1 ක් සඳහා රු.500/= ක් ද වේ.<br>ඉදිකිරීම් අදියර වහල මට්ටම දක්වා ඉදිකොට ඇති විට නේවාසික ව.මී.1 ක්සඳහා රු.300/= ක් ද නේවාසික නොවන ව.මී. 1 ක් සඳහා රු.1000 ක් ද වේ.<br>ඉදිකිරීම් අදියර වහලය ඇතුලුව ඉදිකොට ඇති විට නේවාසික ව.මී 1 ක් සඳහා රු.400/= ක් ද නේවාසික නොවන ව.මී. 1 ක් සඳහා රු.1500/= ක් ද වේ.<br>සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට නේවාසික ව.මී. 1 ක් සඳහා රු. 500/= ක්ද නේවාසික නොවන ව.මී.1ක් සඳහා රු.2000/= ක් ද වේ |
| | 3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 03 (ඉල්ලීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකිය) | | | | |
| | 4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රාදේශවලට පමණක් අදාළ වේ. | | | | |
| | 5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික | | | | |
| | 4. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | | | | |
| | 7. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක් | | | | |
| | 8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතුය | | | | |
| අනුකූලතා සහතිකය නිකුත් කිරීම | 1. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ සඳහන් කර ඇති සියලුම සහතික හා නිර්දේශිත ලිපි | පෙරටු කාර්යාල නිලධාරි | 1.තාක්ෂණ නිලධාරි | දින 14 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව ගබිමේ ප්‍රමාණය ව.මී. 400 දක්වා තනි පුද්ගල |

| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා | වෙනත් නිලධාරීන් | කාර්ය නිම කිරීමට ගත අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| | | 3. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | | 2.විෂය භාර නිලධාරි | | රු. 4000/= ක් ද , මහල් රු.5000/= ක් ද , නේවාසික නොවන රු.5000/= ක් ද, වේ. ගෙබිමේ ප්‍රමාණය ව.මී. 400ට වැඩි තනි පුද්ගල රු.4000 + ව.මී. 400 ට වැඩි වන සෑම ව.මීටර 1 කට හෝ ඉන් කොටසක් සඳහා රු.20/= බැගින්ද නේවාසික නොවන රු.5000 + ව.මී. 4000 වැඩි වන සෑම ව.මී1 ට හෝ ඉන් කොටසක් සඳහා රු.25/= බැගින්ද වේ. |
| 06. | වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3.ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>4. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | පෙරටු කාර්යාල නිලධාරි | 1.තාක්ෂණ නිලධාරි<br>2. විෂය භාර නිලධාරි | වීථි රේඛා -<br>1. නියම කර නැති විට, දින 03<br>2. නියම කර ඇති විට, දින 5 | රු 750 /= |
| 07. | නොපවරා ගැනීමේ සහතික නිකුත් කරීම | 1.නොපවරා ගැනීමේ ඉල්ලීමේ ලිපියක්<br>2. . . ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>3.සභාවට අය වීමට ඇති සියලූ මුදල් ගෙව අවසන් කර තිබිය යුතු . | පෙරටු කාර්යාල නිලධාරි | Ri වරිපනම් විශය නිලධාරි | දින 03 | රු. 700/= |
| 08. | වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය<br>2.පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වන විට වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සහතික කළ පිටපතක් | පෙරටු කාර්යාල නිලධාරි | 1.මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>2. තාක්ෂණ නිලධාරි | දින 14 | ස්ථානයේ වාර්ෂික වටිනාකම මත නියම කෙරේ |
| 09. | ව්‍යාපාර බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ව්‍යාපාර බදු නිවේදනය | පෙරටු කාර්යාල නිලධාරි | 1.ආදායම් පරීක්ෂක | විනාඩි 15 | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 148, 149 වගන්ති අනුව |
| 10. | කර්මාන්ත බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ කර්මාන්ත බදු නිවේදනය | පෙරටු කාර්යාල නිලධාරි | 2.ආදායම් පරීක්ෂක | විනාඩි 15 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11. | පරිසර ආරක්ෂණ බලපත්‍රය | 1.නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය<br>2.ව්‍යාපාරයලියා පදිංචි කිරීමේ සහතිකයේ,සහතික කළ පිටපතක්<br>3.අනුමත ගොඩනැගිලි සැලැස්මේ පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ) | පෙරවු කාර්යාල නිලධාරි | 1.විෂය භාර නිලධාරි<br>2. තාක්ෂණ නිලධාරි<br>3.තාක්ෂණික කමිටුව | දින 14<br>250,000>3000<br>250,001-3,750.00<br>500,001-10,000.00<br>1,000,000 ට වැඩි | පරීක්ෂා කිරීමේ ගාස්තුව රු.3750/=<br>බලපත්‍රය රු . 3,000.00 |
| # | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා | වෙනත් නිලධාරීන් | කාර්ය නිම කිරීමට ගත අවම කාලය | අදාළ ගාස්තුව |
| 12. | ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනා අවසර පත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2.A4 කඩදාසියක මුද්‍රණය කරන ලද,ප්‍රදර්ශනය කරීමට අදහස් කරන දැන්වීමෙහි සමරූපි ආදර්ශයක් (යොදා යුතු ලබන වර්ණ ද සහිත ව)<br>3.දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ඒ සඳහා ඉඩ දෙන ලද බව ප්‍රකාශිත ලිපියක් | පෙරවු කාර්යාල නිලධාරි | 1විෂය භාර නිලධාරි<br>2. ආදායම් පරීක්ෂක | දින 03<br>ව.අ. 1 ට රු. 100/= බැගින් | අවසර පත්‍ර ගාස්තුව දැන්වීමේ වර්ගඵලය මත නියම කරනු ඇත. |
| 13. | වරිපනම් අය කිරීම | 1.සභාව විසින් තමන් වෙත එවනු ලැබූ තක්සේරු නිවේදනය | පෙරවු කාර්යාල නිලධාරි | | විනාඩි 15<br>වාර්ෂික වටිනාකමින් 9% ක මුදලක් | තක්සේරු නිවේදනයේ දැක්වෙන මුදල |
| 14. | මාර්ග පළුදු කිරීමට අවසර ඉල්ලීම | 1.නිවැරදි සම්පූර්ණ කල ඉල්ලුම් පත්‍රය<br>2.සේවා සැපයුම්කරු විසින් නිකුත්කරනු ලැබූ ලිපියේ පිටපතක් | පෙරවු කාර්යාල නිලධාරි | 1.තාක්ෂණ නිළධාරී | දින 05 | පළුදු කිරීමේ ප්‍රමාණය අනුව වෙනස් වේ |

එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ආර්. දිසානායක සිරිපාල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා

5.1.3 හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ 2024-2028 දක්වා පස් අවුරුදු සැලැ සකස් කිරීම සඳහා සහභ සඳහන් කමිටුව පත්කිරීම සුදුසු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා ක ලදී.

1. එම්.එච්.ටී.පී. දිල්රුක්ෂි මිය
2. ඩබ්.ඒ.ඒ.එස්.ජී. කුමාරි මිය
3. වයි.එන්. සමරවීර මිය
4. ඒ.එච්. රේණුකා මිය
5. ඩබ්.පී. නුවන් සමීර මයා
6. එම්.කේ. ක්‍රිෂාන් චානුක මයා
7. හර්ෂණී මුණසිංහ මිය
8. ජී. දිනුෂා ලක්මාලි මිය
9. එම්.ජී. සුමුදු චතුරානි මිය
10. ටී.ඩී.බී. ආරච්චිගේ මිය
11. එච්.පී.ටී. මදුරංස මහතා
12. පී.එම්. රශ්මි මධුමෙබලා මිය
13. ආර්.පී.ජී.ඩී. තක්ෂිලා මෙ.වි
14. ඩබ්.බී. සුනේත්‍රා මිය

එම යෝජනාව ගරු මන්ත්‍රී එච්.ඒ. නිහාල් චන්දන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා

5.1.4 හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභා සම්මත විය යුතු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණයට ලක් කර ඇති ස්ථාන

පහත සඳහන් ස්ථානයන් සතුව ඇති භාණ්ඩ හා රථවාහන සමීක්ෂණයට ලක් කරන ලදී.

01. ප්‍රදේශීය සභා කාර්යාලය
02. පැරණි ප්‍රදේශීය සභා කාර්යාලය
03. දැහැමිපුර මහජන පුස්තකාලය
04. උඩබැරගම මහජන පුස්තකාලය
05. සිසිලසගම මහජන පුස්තකාලය
06. වලව ප්‍රේමානන්ද පෙර පාසල

07. උඩබැරගම බෝසත් පෙර පාසල
08. කසල කළමනාකරණ මධ්‍යස්ථානය
09. නීල ගජබා ප්‍රජා මණ්ඩලය - පහළ බැරගම
10. රත්තරු ප්‍රජා මණ්ඩලය - සියඹලාගස්විල දකුණ
11. මිණිමුතු ප්‍රජා මණ්ඩලය - සියඹලාගස්විල උතුර
12. ගෝඨාභය ප්‍රජා මණ්ඩලය -ගොඩවාය
13. පිබිදෙන ප්‍රජා මණ්ඩලය - ගොන්නොරුව
14. දිලෙනතරු ප්‍රජා මණ්ඩලය - එලල්ල
15. ඉසුරු ප්‍රජා මණ්ඩලය - තම්මැන්නාව
16. සුහද ප්‍රජා මණ්ඩලය - කැටැන්වැව
17. සිතුමිණ ප්‍රජා මණ්ඩලය - බඳගිරිය
18. උදාන ප්‍රජා මණ්ඩලය - යහංගල නැගෙනහිර
19. ජන උදාන ප්‍රජා මණ්ඩලය - ප්‍රල්ගමුව
20. අරුණ ප්‍රජා මණ්ඩලය - සිරියාගම
21. ගාමිණී ප්‍රජා මණ්ඩලය - බුන්දල
22. ජයමුතු ප්‍රජා මණ්ඩලය - පල්ලෙමලල
23. සිසිලස ප්‍රජා මණ්ඩලය - සිසිලසගම
24. දිරිය ප්‍රජා මණ්ඩලය - මානාප්ජාව
25. සවිබල ප්‍රජා මණ්ඩලය - දෙහිගහලන්ද
26. පුබුදු ප්‍රජා මණ්ඩලය - වලව
27. මයුර ප්‍රජා මණ්ඩලය - බැල්ලගස්වැව
28. සුමුදු ප්‍රජා මණ්ඩලය - උඩබැරගම
29. අරුණළු ප්‍රජා මණ්ඩලය - අරවනමුල්ල
30. ගමපුබුදු ප්‍රජා මණ්ඩලය - ගල්වැව

<u>භාණ්ඩ සමීක්ෂණයේදී පරික්ෂාවට ලක්කරන ලද ලේඛණ</u>

01. බඩු වට්ටෝරු පොත01 (පිටු අංක 01 සිට 100 දක්වා වූ)
02. බඩු වට්ටෝරු පොත 02 (පිටු අංක 01 සිට 27 දක්වා වූ)
03. තොග ලේඛනය අංක 01
04. තොග ලේඛනය අංක 02
05. ලිපි ද්‍රව්‍ය ලේඛනය
06. පාරිභෝජන ලේඛනය
06. සිසිලසගම පුස්තකාලය
    I. පරිග්‍රහණ ලේඛන අංක 01 (පරිග්‍රහණ අංක 01 සිට 3063 දක්වා)
    II. පරිග්‍රහණ ලේඛන අංක 02 (පරිග්‍රහණ අංක 03064 සිට 3499 දක්වා)
    III. පරිග්‍රහණ ලේඛන අංක 03 (පරිග්‍රහණ අංක 3500 සිට 8712 දක්වා)
    IV. පරිග්‍රහණ ලේඛන අංක 04(පරිග්‍රහණ අංක 8713 සිට 11397 දක්වා)



CamScanner

07. උඩබැරගම පුස්තකාලය (පරිග්‍රහණ අංක 01 සිට 5101 දක්වා)

08. දැහැමිපුර මහජන පුස්තකාලය (පරිග්‍රහණ අංක 01 සිට 4634 දක්වා)

09. ගබඩා ලැබීම ලේඛන- අංක 08 පොත සිට අංක 12පොත දක්වා (ලැබීම
1353සිට - 1588 දක්වා)

10.නිකුත් කිරීමේ නියෝග- අංක 35 පොත සිට අංක 41 පොත දක්වා ( ලැබීම
1723 සිට - 2072 දක්වා)

11. ප්‍රජා මණ්ඩල බඩු බෙදා හැරීමේ ලේඛණය

<u>තොග ලේඛන පරීක්ෂාව</u>

- ලේඛණ නඩත්තුව යහපත් මට්ටමක පවතී.

<u>ලිපි ද්‍රව්‍ය ලේඛණය පරීක්ෂාව</u>

- ලිපි ද්‍රව්‍ය ලේඛණ නඩත්තුව යහපත් මට්ටමක පවතී.

<u>ගබඩා ලැබීම හා නිකුත් කිරීමේ ලේඛණ පරීක්ෂාව</u>

ගබඩා ලැබීම ලේඛණ හා නඩත්තු කිරීමේ ලේඛණ නඩත්තුව යහපත් මට්ටමක පවතී.

<u>පුස්තකාල පරීක්ෂාව</u>

01. පුස්තකාල පවත්වාගෙන යාම පොදුවේ යහපත් මට්ටමක පවතී.

<u>ප්‍රජා මණ්ඩල පරීක්ෂාව</u>

බල ප්‍රදේශයේ වසම 23න් වසම 22කම දක්නට ලැබෙන ප්‍රජා මණ්ඩල වලට ලබා දී ඇති භාණ්ඩ පරීක්ෂා කිරීමේදී ඒවා මහජනතාවගේ පොදු කටයුතු වෙනුවෙන් භාවිතා කරන බව හඳුනා ගැනීමට හැකි විය. ඒව සෑම ප්‍රජා මණ්ඩලයකම නිලධාරි මහතෙකුගේ නිවසේ ගබඩා කර ඇති අතර ඒ සඳහා නිසි පරිදි නඩත්තු කර ගෙන යාම අපහසු බව නිරීක්ෂණය විය.

<u>පොදු ගබඩාව හා භාණ්ඩවල තත්‍ය ශේෂය පරීක්ෂාව</u>

- භාණ්ඩ කේත කර තිබීම නිසා තත්‍ය ශේෂය පරීක්ෂා පහසු වූ අතර ඇතැම් භාණ්ඩ තැන් තැන් වල තිබීම හේතුවෙන් අපහසුතාවන්ට ලක් වීමට ද සිදු විය.

<u>2021 වර්ෂයේ සිදු කරනු ලැබූ භාණ්ඩ සමීක්ෂණයෙන් ලබා දුන් නිර්දේශවලින් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ නිර්දේශ සඳහා ලබා දෙන යෝජනා</u>

උපලේඛණ අංක 01 යටතේ දක්වා ඇති භාන්ඩ සඳහා එහි සඳහන් ආකාරයට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමු.



CamScanner

උප ලේඛණ අංක 01

| අනු අංකය | භාණ්ඩයේ නම | කොටස හා අංකය | ලෙජරය අනුව වෙන්දේසි වන ගණන | නිර්දේශ කරන යෝජනාව |
|---|---|---|---|---|
| 01 | Key board | 17 | 02 | අපහරණ කමිටුවක් මඟින් අපහරණය කිරීම |
| 02 | අඩි 100 හෝස් LK 4299 | 41 | 01 | වෙන්දේසි කිරීම |
| 03. | මෙරුන්පාට පරිගණක මේස | 01 | 01 | වෙන්දේසි කිරීම |
| 04. | අඟල් 3 Green හෝස් | 02 | 01 | වෙන්දේසි කිරීම |

2022.12.31 දිනට සිදු කරනු ලැබූ භාණ්ඩ සමීක්ෂණයෙන් පසු මණ්ඩලය විසින් පුස්තකාල වලට කරන නිර්දේශ

01. (U) ඌණතා ලෙස වාර්තා වූ පහත උපලේඛණ අංක 02 යටතේ දක්වා ඇති පහත පොත්වල අලාභය මූ.රෙ. පරිදි අය කිරීම නිර්දේශ කරන අතර ඊලගට පවත්වන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට ලදුපත් අංක ඉදිරිපත් කර පොත්වලින් කපා හැරීම නිර්දේශ කරමු.

දැහැමිපුර පුස්තකාලය ඌණතා පොත් ලේඛණය

උපලේඛණ අංක 02

| පරිග්‍රහණ අංකය | පොතේ නම | මිල |
|---|---|---|
| 661 | 8 ශ්‍රේණිය ගණිත හුරුව | 200.00 |
| 824 | සුපහන් ජීවිතයට අත්වැලක් | 75.00 |
| 1881 | බැස්කවිල් රුදුරු බල්ලා | 350.00 |
| 2299 | පිට මැද්දට පාර තුනයි | 100.00 |
| 2338 | පිංවන්ත ගිරවා | 50.00 |
| 2847 | දණ්ඩියි බණ්ඩියි | 50.00 |
| 2961 | සිහිනය මියදුණු වගයි | 675.00 |
| 3157 | තුෂර බිංදු | 410.00 |
| 3103 | දෝලනය හා තරංග | 350.00 |
| 3612 | කාර්යාල ක්‍රම | 200.00 |
| 3940 | පායන්න සිත් අහසේ | 590.00 |
| 3941 | යලිත් එන්නට දුර වැඩියි | 550.00 |
| 4307 | උ.පෙළ ජීව විද්‍යාව | 450.00 |
| 4362 | යකඩ යුගය | 400.00 |

02. R අක්ෂරය ලෙසින් වාර්තා වූ උපලේඛණ අංක 03 යටතේ දක්වා ඇති අලුත් වැඩියා පරිහරණයට ගත හැකි තත්ත්වයේ පවතින පොත් අලුත් වැඩියා කිරීම සඳහා අදාළ කටයුතු සිදු ... මෙන් නිර්දේශ කරමු.

<u>අලුත්වැඩියා කළ යුතු පොත් ලේඛණය -දැනැම්පුර</u>

<u>උපලේඛණ අංක 03</u>

| පිවිසුම් අංකය | පොතේ නම | මිල |
|---|---|---|
| 3240 | සෙනුරි | 500.00 |
| 3261 | හුස්මක් තරම | 700.00 |
| 3936 | පෙම්වතියෝ 05 | 540.00 |
| 3269 | දෙනුවන් අද්දර | 460.00 |
| 3928 | හංසනා | 650.00 |
| 3939 | හංසනා 02 | 650.00 |

03. පහත අංක 04 උපලේඛනය යටතේ දක්වා ඇති භාණ්ඩාගාර පොදු 66හි S අක්ෂරය සටහන් කර ද... භාණ්ඩ ඇගයීම් කමිටුවකින් තක්සේරු කර වෙන්දේසි කිරීම නිර්දේශ කරමු.

<u>උප.ලේඛණ අංක 03</u>

| අනු අංකය | භාණ්ඩයේ නම | කොටස හා අංකය | ලෙජරය අනුව වෙන්දේසි වන ගණන |
|---|---|---|---|
| 01 | සවල් | | |
| 02 | වාර්පින් ටෝච | 01 | 02 |
| 03. | LED ටෝච | 01 | 01 |
| 04. | ප්ලාස්ටික් කසල බඳුන් | 01 | 01 |
| 05. | Writing Table CT 03+AH 02 1350×800×750 | 01 | 03 |
| 06. | UPS | 02 | 01 |
| 07. | ප්ලාස්ටික් කසල බඳුන් | 15 | 03 |
| 08. | අඩි 100 හෝස් LK 4299 | 37 | 02 |
| 09. | වාහන බැටරි | 01(කො.ලේ) | 01 |
| 10. | වාහන වලින් ඉවත් කරන ලද බැටරි | 39 | 01 |
| 11. | පුස්තකාල වලින් ඉවත් කරන ලද පත්තර තොගයක් | | 12 |
| | ප්ලාස්ටික් පුටු | 01(කො.ලේ) | 03 |



CamScanner

04 . පහත උපලේඛණ අංක 05 යටතේ දක්වා ඇති වාහන වලින් ඉවත් කරන ලද ටයර් තොගය ඉහිහි පරිදි වෙන් වෙන් වශයෙන් සලකා ලංසු කැඳවා වෙන්දේසි කිරීම නිර්දේශ කරමු.

<u>උපලේඛණ අංක 05</u>

| තොග පොතේ පිටු අංකය(තොග පොත් අංක 03 හි) | විස්තරය | වෙන්දේසි කළයුතු ප්‍රමාණය |
|---|---|---|
| 37 | 750×16 ටයර් | 02 |
| 38 | 255×16 ටයර් | 04 |
| 41 | 600×16 ටයර් | 05 |
| 42 | 900×20 ටයර් | 06 |
| 47 | 650×16 ටයර් | 06 |
| 50 | 750×16 ටයර් | 02 |

05. පහත අංක 06 උපලේඛණය යටතේ දක්වා ඇති භාණ්ඩාගාර පොදු 66හි D අක්ෂරය සටහන් කර ඇති නැවත භාවිතා කළ නොහැකි ඉවත් වන ප්‍රමාණ සටහන් කිරුවේ ඇති ශේෂයන් ඉවත් කර පොත් වලින් කපා හැරීමට නිර්දේශ කරමු.

<u>උප ලේඛණ අංක 06</u>

| අනු අංකය | භාණ්ඩයේ නම | කොටස හා අංකය | ලෙජරය අනුව ඉවත් වන ගණන |
|---|---|---|---|
| 01 | අගල් 6 කටු | 40 | 01 |
| 02 | විදුරු | 51 | 10 |
| 03. | 1000w ජ්ලැෂර් | 01(තො.ලේ.) | 08 |

06. පහත උප ලේඛන අංක 07 යටතේ දක්වා ඇති භාණ්ඩාගාර පොදු 66 හි R අක්ෂරය යෙදූ භාණ්ඩ අළුත් වැඩියා කිරීම නිර්දේශ කරමු.

<u>උප ලේඛණ අංක 07</u>

| අනු අංකය | භාණ්ඩයේ නම | කොටස හා අංකය | ලෙජරය අනුව අළුත්වැඩියා කළයුතු ගණන |
|---|---|---|---|
| 01 | Hone 18 AHUJA | 27 | 01 |



CamScanner

07. පැරණි කාර්යාලයේ ඇතට ප්‍රයෝජනයට නොගෙන පාවච්චියට ගත හැකි මට්ටමේ ඇති ... ඒඩියක පුටු, කුෂන් කරන ලද පුටු, රෝනියෝ යන්ත්‍රය, යතුරු ලියනය යන ආදිය බල ප්‍රදේ... පෙර පාසල්, වෙනත් රජයේ ආයතන, පුස්තකාල යන ආදියට ලබාදීම සුදුසු බවට යෝජනා කරමු.

08. ප්‍රාදේශීය සභා පරිශ්‍රය, පැරණි සභා කාර්යාලය, කොම්පෝස්ට් මධ්‍යස්ථානය යන ස්ථානවලට ... ඇති CCTV කැමරා පද්ධතියෙන් කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කැමරාවන් අක්‍රියව පැවති ... කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කැමරා පද්ධතිය අකුණු ගැසීමක් හේතුවෙන් විනාශ වී ඇත. ඒ ... විශාල පිරිවැයක් දරා ඇති බැවින් ඒවා අළුත්වැඩියා කර ඵලදායීව යොදවා ගැනීමට යෝජනා කරමු.

09. අවනාමුල්ල රංගිරි ප්‍රජා ශාලාවෙන් ගෙනෙන ලද මේසය හා පුටු 10 ඉන්වෙන්ට්‍රි ගත කර නොමැ... අතර එම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත කර වෙන්දේසි කිරීම සුදුසු බව නිර්දේශ කරමු.

10. ප්‍රාදේශීය සභා කාර්යාල ඉදිරි කොටසේ තබා ඇති වතුර පිල්ටරය භාවිතා නොකරන ... නිරීක්ෂණය වූ අතර ආයතනයෙන් රාජකාරි කටයුතු කර ගැනීමට පැමිණෙන ජනතාවට ප්‍රයෝජ... ගත හැකි ආකාරයට එය සකස් කරන ලෙසට යෝජනා කරමු.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.කේ. උපුල් සංජය මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර, උපසභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

නැවත කාරක සභාව මහා සභාව බවට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන... අතර, ගරු උපසභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

06. <u>කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.</u>

6.1. <u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

6.1 2023.01.04 දින පැවති පරිසර හා පහසුකම් කාරක සභා හා වෙරළ දූෂණය වැළැක්වීමේ කා... සාධන කමිටු නිර්දේශ වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

6.1.1 ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා විසින් 2023.01.04 දින පැවති පරිසර හා පහසුක... කාරක සභා හා වෙරළ දූෂණය වැළැක්වීමේ කාර්ය සාධන කමිටු නිර්දේශ වාර්තාව සභා සම්මත විය යු... යයි යෝජනා කරන ලදී.

01) පරිසර හා පහසුකම් කාරක සභාවේ ගරු සභාපති ජේ.ආර්.දිසානායක සිරිපාල මහතා... ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී. පැමිණි සියලුදෙනා හමබන්තො... ප්‍රාදේශීය සභාවේ ලේකම් එන්.ජී.එල්.ගුණතුංග මිය විසින් පිළිගැනීමෙන් පසු සභ ආගම සිහිකිරීමෙ... අනතුරුව කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

කමිටුව රැස්වීම ආරම්භ වී මද වේලාවකට පසු ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ගාමිණී සමරගුණරත්... මහතාගේ පැමිණීම සිදුවූ අතර එතුමා විසින් රැස්වීමේ වැඩ කටයුතු ඉදිරියට පවත්වා ගෙනයන ලදී...



CamScanner

අවසන් වරට 2022/03/29 දින පරිසර කමිටුව කැඳවා ඇති බවත් පසුගිය කාලය තුළ කොරෝනා වසංගත තත්වයන් හේතුවෙන් මෙම රැස්වීම කැඳවීම කල් තැබුනු අතර 2022/12/05 දින පරිසර හා පහසුකම් කාරක සභාව කැඳවනු ලැබුවද නිළධාරින්ගේ නොපැමිණීම හේතුවෙන් කමිටු රැස්වීම කල් තබන ලද බව පැහැදිලි කරන ලදි. පරිසර හා පහසුකම් කාරක සභාවත් වෙරළ දූෂණය අවම කිරීම සඳහා වූ කාර්ය සාධන බලකායේ කමිටු රැස්වීම යන කමිටු දෙකම හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසර ගැටළු හා විසඳුම් සාකච්ඡා කිරීම සිදුවන බැවින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ඒ. එල්. ප්‍රදීප් කුමාර මහතා විසින් මෙම කමිටු රැස්වීම් දෙකම එකට කැඳවීම තුලින් නිළධාරින්ගේ සහභාගිත්වය ලබාගත හැකි බවත් බූන්දල, බදගිරිය වැනි දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණෙන දුර බැහැර නිළධාරින් හට එය ඉතා පහසුවක් වන බව පෙන්වා දෙන ලදි. පවතින ආර්ථික දුෂ්කරතා සහ රජයේ වියදම් අවම කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව මෙම කාර්ය සාධන බලකා කමිටුව පරිසර හා පොදු පහසුකම් කමිටුව සමග සම්බන්ධ කොට ඉදිරියට පවත්වාගෙන යාමට නිර්දේශ කරන ලදි.

02) 2021/03/29 දින පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභාවේ හා 2021/04/06 දින පවත්වන ලද වෙරල දූෂණය අවම කිරීම සඳහා වූ කාර්ය සාධන බලකා කමිටුවේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

| කාරණය | ප්‍රගතිය හා ගනු ලැබූ තිරණ |
|---|---|
| 01 බදගිරිය හා තෙළුල්ල පොලවල් දෙකෙහි කසල කුටි ඉදිකිරීම | 2022 වර්ෂයේ සංවර්ධන කටයුතු නතර කිරීමත් ,සභාවේ ආදායම් අඩු වීමත් භාණ්ඩ මිල සිග්‍රයෙන් ඉහල යාමත් හෙතුවෙන් කසල කුටි ඉදිකිරීම ප්‍රමාද විය. නැවත නව ඇස්තමේන්තුවක් සකස් කිරීමට කමිටුව තීරණය කරන ලදි. වගකීම තාක්ෂණ නිළධාරි ඩී.එච්. ලක්මාල් මහතා වෙත පවරන ලදි. |
| 02 ආයෝජන කලාපයෙන් ඉවත ලන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවෙන් ලබා නොගන්නා බවට BOI ආයතනය දැනුවත් කිරීම | ඇගළුම් ආයතනය තුනකින් ඉවතලන අපද්‍රව්‍ය (නූල් කැබලි) තව දුරටත් ප්‍රාදේශීය සභාවට ලබාගත නොහැකි බව BOI ආයතනය ලිඛිතව දැනුවත් කර ඇත. |
| 03) දූම්දූ ලුණු කර්මාන්තයෙන් අප ජලය මුදා හැරීම | 2022/11/17 දින පරිසර අංශය මගින් ස්ථානිය පරික්ෂණයක් සිදුකර ඇත. අප ජලය මුදාහරින ටැංකි ඉදිකර නොමැති බැවින් 2022/01/10 සහ 2022/11/24 පෙරහන් පද්ධතියක් සකස් කරන ලෙසට ලිඛිතව දන්වා ඇත. මෙම ආයතනයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ කාලය අවසන් වී ඇත. අඩු පාඩු සකස් කරන ලෙසට නැවත දන්වා යැවීමට කමිටුව තීරණය කරන ලදි. |
| 04) අම්බලන්තොට නගරයේ ප්‍රධාන කාණුව පවිත්‍ර කිරීම | කාණු පවිත්‍ර කිරීමේ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉටුකර නොමැත. එම ආයතනයට කාණු පවිත්‍ර කරන ලෙසට නැවතත් ලිඛිතව දන්වා යැවීමට කමිටුව තීරණය කරන ලදි. වගකීම පරිසර විෂය නිළධාරී |
| 05 වරාය පොලිසිය සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදෙන ලෙස ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා වෙත ඉල්ලීම් ලිපියක් යැවීම | ගරු අමාත්‍ය තුමා වෙතින් ලිඛිතව ඉල්ලීම කර ඇත. |
| 06 සභා මාර්ග දෙපස පවිත්‍ර කිරීමේ වැඩ සටහන් සමුද්‍රීය ආරක්ෂණ අධිකාරියේ නිළධාරින් සමග මසකට එක් දිනක් සිදු කිරීම සම්බන්ධයෙන් | 2022/05/24 දින හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත හා සමෘද්ධි අධ්‍යක්ෂක වෙත දන්වා ඇත. |



CamScanner

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් හා සමුද්‍රීය ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂක වෙත දන්වා යැවීම. | |
| (07) කාබනික පොහොර මිල අඩු කිරීම | කාබනික පොහොර මිල රු 20/- සිට රු.15/- දක්වා අඩු ... ඇත. |
| (08) කොස් පැල 100000 ක් රෝපනය හර සිටුවීමේ වැඩසටහන සඳහා පැල 300 ක් සිටුවීම | ප්‍රාදේශීය සහා භූමිය, කසල කළමනාකරණ මධ්‍යස්... ඇතුළු ස්ථාන කිපයක පැළ රෝපනය කළද ව... නොමැති වීම හා අලින්ගෙන් සහ ගවයන් ගෙන් සි... හානිය හේතුවෙන් රුක්රෝපණ කටයුතු සාර්ථක ... ගැනීමට නොහැකි වී ඇති බව ගරු සභාපති තුමා පැහ... කරන ලදී. |
| (09) ධීවර ප්‍රජාව විසින් අක්‍රමවත් ලෙස කසල බැහැර ලීම වලකාලීම සඳහා මිරිජ්ජවිල සිට ගොඩවාය වෙරළ තීරයේ කසල බඳුන් ස්ථාපිත කිරීම. | මෙහි වගකීම සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය වෙත පැ... තිබුනද මෙ දක්වා ඉටුකර නොමැත. ප්‍රතිපාදන නොමැති ... හේතුවෙන් ඉටු කළ නොහැකි වූ බව සමුද්‍රීය ආරක්... අධිකාරිය පැහැදිලි කරන ලද අතර 2023 වර්ෂ... අනුග්‍රාහක ආයතනයක දායකත්වය ලබාගෙන කසල බ... ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන බව පැහැදිලි ක... ලදි. වගකීම සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය |
| 10) වෙරළ සීමාව තුල නිවාස ඉදි කිරීමට අවසර ලබා නොදීම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම | ගොඩවාය සිට සිසිලසගම දක්වා වෙරළ තීරයේ නිවාස ... කිරීමේදි අවසර ලබා ගැනීම සම්බන්ධයෙන් 2021/05/... දින සිසිලසගම විහාරස්ථානයේදි දැනුවත් කිරීමෙ ... සටහන් සිදුකර ඇත. තව දුරටත් මෙ සම්බන්ධයෙන් වෙ... කලාපයේ ජනතාව දැනුවත් කිරීම සුදුසු බවට කමිටු... නිර්දේශ කරන ලදි. වගකීම වයි.එන්.සමරවීර මිය. |

03 මෙදින සාකච්ජාවේදි සාකච්ඡා කළ කරුණු

| | |
|---|---|
| 01 ලංවා සිමෙන්ති කර්මාන්ත ශාලාවෙන් පරිසරයට දූවිලි අංශු නිකුත් වීම | ලංවා සිමෙන්ති ආයතනය මහජන පැමිණිලි හේතුවෙ... අවස්ථා දෙකකදි ස්ථානිය පරික්ෂණයන් සිදුකළ අතර අව... පරිසරයේ පැතිර යන දූවිලි අවම කරන ලෙසට මධ්‍ය... පරිසර අධිකාරිය උපදෙස් ලබාදි ඇත. එසේ වුවත් මහජ... පැමිණිලි තව දුරටත් ලැබෙමින් පවතින බව ගරු සභාප... සමරගුණරත්න මහතා පැහැදිලි කරන ලදි. තව දුරට... ස්ථානිය පරික්ෂණයක් සිදුකිරීම අවශ්‍ය බවට මධ්‍යම පරිස... අධිකාරිය වෙත දන්වා යැවීම සුදුසු බවට කමිටුව තිරණ... කරන ලදි.- වගකිම පරිසර විෂය නිළධාරි |
| 02 ගොඩවාය කළපුවේ සිටුවන ලද කඩොලාන ශාක ගවයන් විනාශ කිරීම. | හැංග්‍රිලා හෝටලයේ අනුග්‍රහයෙන් ගොඩවාය කළපුවේ... කඩොලාන ශාක 100 ට අධික ප්‍රමානයක් සමුද්‍රිය පරිස... ආරක්ෂණ අධිකාරිය විසින් සිටුවන ලද බවත් කලපුව හරහ... ගවයන් ගමන් කිරීමෙන් එම ශාක විනාශ වන බවත් පැහැදිලි කරන ලදි. කඩොලාන ශාක ආරක්ෂා කර ගැනීම සඳහා අම්බලන්තොට පොලිසියට දන්වා යැවීමට කමිටුව තිරණය කරන ලදි. වගකීම පරිසර විෂය නිළධාරි. |
| 03 අයාලේ යන ගවයන් පාලනය කිරීම. | අයාලේ යන ගවයන් සම්බන්ධයෙන් ගව හිමියන් දැනුවත් කිරීමෙ වැඩ සටහන් කිපයක් ප්‍රාදේශිය සභව මගින් සිදුකළ ද... නිදැල්ලේ යන ගවයන් ප්‍රමාණය දිනෙන් දින වැඩිවන බව සභාපතිතුමා පැහැදිලි කරන ලදි. ගව හිමියන් සඳහා තෘණ භූමි ලබාදිම සම්බන්ධයෙන් මහවැලි අධිකාරියෙන් |

CamScanner

| | |
|---|---|
| | තොරතුරු ලබා ගැනීමටත් ග්‍රාම නිළධාරි මගින් ගව ගිමියන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් ගව ගිමියන් නැවත දැනුවත් කිරීමටත් සුදුසු බව කමිටුව තිරණය කරන ලදී. වගකීම පරිසර විෂය නිළධාරි |
| 04. කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිම | කාබනික පොහොර නිෂ්පාදනයෙදී යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකරවීම සහ අවශ්‍ය අමු ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා අමතර ග්‍රමිකයන් අවශ්‍ය බවත් විදුලි වැටෙහි ඉදිරිපස පමණක් විදුලිය ඇති බවත් පැති කුනාක විදුලිය නොමැති බවත්, විදුලිය විසන්ධි වූ අවස්ථාවෙදී විදුලි වැට ක්‍රියාත්මක කිරිම සඳහා විකල්ප ක්‍රමවෙදයන් නොමැති බවත් ඝණ අප ද්‍රව්‍ය කළමනාකරණ නිළධාරි කුමාරි මිය විසින් පැහැදිලි කරන ලදී. පොහොර නිෂ්පාදනය වැඩිකර ගැනීම සඳහා ගොම, දහයියා,ඇල්බිසියා සහ ජබර ගන්නා ලෙසත් විදුලි වැට කඩිනමින් සකස් කරන බවත් කමිටුව නිර්දේශ කරන ලදී. විදුලි වැට කඩිනමින් සැකසීමෙ වගකීම. තාක්ෂණ නිළධාරි ලක්මාල් මහතා |

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී. ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

07. ලැබීම් සහා වියදම් මාසික ප්‍රකාශන හා ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා

7.1. . 2022 නොවැම්බර් මස සභා තීරණ ක්‍රියාත්මක කිරිමෙ ප්‍රගති වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

7.1.1. ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා විසින් 2022 නොවැම්බර් මස සභ තීරණ ක්‍රියාත්මක කිරිමෙ ප්‍රගති වාර්තාව සභා සම්මත විය යුතු යයි යෝජනා කරන ලදී.

| සභා තීරණය | ඉටු කළ යුතු නිලධාරියා | ඉටු කළ දිනය | ප්‍රගතිය |
|---|---|---|---|
| 5.1.1 නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර ( ඉඩම) මගින් යොමු කර ඇති 2019.09.09 දිනැති කොක/ මයු/ ඉ/38 සමාංක දරණ හම්බන්තොට ප්‍රාදේශීය සභාවට යොමු කර ඇති ලිපියට අනුව හම්බන්තොට ප්‍රාදේශීය සභාව ඉදිරිපිට කඩ කාමර 12 පිහිටි ඉඩම විශේෂ ආර්ථික කළාපය සඳහා පවරාදීමට නියමිතව ඇති බැවින් හම්බන්තොට ප්‍රාදේශීය සභාවට පවරා දීමට හැකියාවක් නොමැති බව දන්වා එවා ඇති ලිපිය අදාල කර ගනිමින් මෙම කඩ කාමර 12 සහිත ඉඩම හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අදාල ලිපි ලේඛනද බදුකරුවන්ද සමග හම්බන්තොට මහා නගර සභාවට බාර දීම සුදුසු යයි යෝජනා කරන ලදී.<br><br>තීරණය - නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර ( ඉඩම) මගින් යොමු කර ඇති 2019.09.09 දිනැති කොක/ මයු/ ඉ/38 සමාංක දරණ හම්බන්තොට ප්‍රාදේශීය සභාවට යොමු කර ඇති ලිපියට අනුව හම්බන්තොට ප්‍රාදේශීය සභාව ඉදිරිපිට කඩ කාමර 12 පිහිටි ඉඩම විශේෂ ආර්ථික කළාපය සඳහා පවරා දීමට යෝජනා වී ඇති බැවින් සහ | ආදායම් පරීක්ෂක නිළදාරි | | ක්‍රියාත්මක විය |

| | | | |
|---|---|---|---|
| හම්බන්තොට ප්‍රාදේශීය සභාව හා හම්බන්තොට මහ නගර සභාව ඒකාබද්ධ කිරීමට යෝජනා වී ඇති නමුත් මෙම කඩකාමර 12 සහිත භූමිය අදාල ලිපිගොනු, ලේඛන හා බදුකරුවන්ද සමග හම්බන්තොට මහ නගර සභාවට බාර දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 5.1.4 2023 වර්ෂයේ මෘදුරපුර සතිපොළෙහි ලංසුව වැඩිම ඉල්ලුම්කරු වන විජේසේකර ආරච්චිගේ සාලිය කුමාර මහතා විසින් සිදු කරන ලද ඉල්ලීම සලකා බලා 2023 වර්ෂයේ ගිවිසුම්ගත වීමේදී වාරික මුදල් ගෙවන දිනය සෑම මාසයකම 25 වන දිනය ලෙස යොදා ගැනීම සුදුසු යයි යෝජනා කරන ලදී.<br><br>තීරණය - ගිවිසුමට අනුව මුදල් ගෙවීමේ දිනය සෑම මසකම 30 දිනට වෙනස් කළ නොහැකි බවත්, එයට හේතුව පෙබරවාරි මාසය අවසන් වන්නේ 28,29 දිනාවලින් බැවින් එම දිනය ලබාදීමට නොහැකි බව ප්‍රකාශ කරන ලද අතර, සෑම මසකම 25 වන බදු මුදල් තැන්පත් කළයුතු බවත්, 25 වන දිනය සෙනසුරාදා, ඉරිදා දිනයක් වුවහොත් ඊට පෙර දින අනිවාර්යයෙන් මුදල් තැන්පත් කළයුතු බවත් ප්‍රකාශ කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. | ආදායම් පරීක්ෂක නිලධාරි | | ක්‍රිය |
| 5.2.1 හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි නිවෙස්වලින් බැහැර කරන ලද කුණු කසල රැගෙන යාමට සතියකට වරක්වත් ප්‍රදේශයේ සෑම පාරකම ට්‍රැක්ටර් රථයක් යෙදවීම සුදුසු යයි යෝජනා කරන ලදී.<br>තීරණය - ගරු මුණසිංහ මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිත වූවක් බවත් ගමේ නිළධාරීන් සම්බන්ධ කරගෙන ප්‍රාදේශීය සභාවේ සම්පත් භාවිතා කරමින් කොට්ඨාශ මට්ටමින් ඉදිරියේදී ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. කුණු කසළ බැහැර කිරීම වාගේම මාර්ගය දෙපස ශුද්ධ පවිත්‍ර කිරීම කළ යුතු බවත් සෑම ගමකම රාජකාරි කරන නිළධාරීන්ට අමතරව පොලීසිය, වාරිමාර්ග, මහවැලි අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදී ආයතනද සම්බන්ධ කරගෙන ඉදිරියේදී හැකි ඉක්මනින් මෙය ක්‍රියාත්මක කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. | කුමාරි මිස් | | බල ආවරණ පරිදි ද්‍රව්‍ය කිරීමෙ වැඩසට ඩෙංගු පාදක ගනිමින් ක්‍රියාත්ම නොදිරා ගැනීමට ප්‍රමාණවා බවට කරගෙන |
| 2.1.4 . විල්මැන්න පාර දෙපස ශුද්ධ පවිත්‍ර කර දෙන ලෙස සුහද ගොවි සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම ලිපිය අනුව හම්බන්තොට | | | |

| | | | |
|---|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා මාර්ගය ශුද්ධ කිරීම සුදුසු යයි යෝජනා කරන ලදී.<br>තීරණය - තාක්ෂණික සේවා නිලධාරී සම්බන්ධ කරගෙන ඉදිරි කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී. | ලක්මාල් මහතා | | ක්‍රියාත්මක |
| 08. කොඩවාය සිගිලගම ප්‍රදේශයේ වර්ෂා ජලයෙන් යටවන නිවාස හා මාර්ගවලට විසඳුමක් ලෙස කාණු ඉදිකර අදාල ස්ථාන වලට බෝක්කු දමා ජලය බැස යාම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම පිළිබඳ යෝජනාව.<br>තීරණය - මෙම මාර්ගය සකස් කිරීම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා මෙම මාර්ගය ජනතා විමුක්ති පෙරමුණේ මුදල් වලින් සකස් කර ඇති බව ප්‍රකාශ කරන බැවින්ද ගරු සුමිත් මන්ත්‍රීතුමා මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් වලින් ඉතිරි වූ මුදලකින් සකස් කරන ලද බව ප්‍රකාශ කරන බැවින් ඉහත මාර්ගය සභාවේ මාර්ගයක් වන බැවින් සභා අනුමැතියකින් තොරව සපත්තු බෝක්කුවක් යෙදීමෙන් තොරව මාර්ගය සකස් කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත ලිපියක් යොමු කරන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී. | ලක්මා මිස් | | ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත ලිපියක් මගින් දැනුම දෙන ලදී. |

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

7.2. 2022 නොවැම්බර් හා දෙසැම්බර් මස යන්ත්‍රෝපකරණ වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

7.2.1. ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා විසින් 2022 නොවැම්බර් හා දෙසැම්බර් මස යන්ත්‍රෝපකරණ වාර්තාව සභා සම්මත විය යුතු යයි යෝජනා කරන ලදී.

**2022 නොවැම්බර් මාසයේ ගලි බවුසරයේ ආදායම**

| අනු අංකය | නම | දිනය | ලදුපත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 01 | එම්.ජී. දිපිකා ප්‍රියදර්ශනී මිය | 2022.11.16 | 18872 | 9700.00 |
| 02 | එල්.ජී. ඩී. මදූරංග මයා | 2022.11.22 | 18906 | 9700.00 |
| 03 | එච්.එම්. බැසිල් චින්තක මයා | 2022.11.23 | 18912 | 9700.00 |
| 04 | ඩබ්. කරුණාදාස මයා. | 2022.11.23 | 18913 | 9700.00 |
| 05 | ඩබ්. ඒ. කසුන් සමීර මයා | 2022.11.23 | 18916 | 9700.00 |
| එකතුව | | | | 48500.00 |



CamScanner

## 2022 නොවැම්බර් මාසයේ J.C.B ආදායම

| අනු අංකය | නම | දිනය | ලදුපත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 01 | ඩී.එන්. හැටුම් මයා | 2022.11.02 | 18822 | 23260.00 |
| 02 | එච්.ඊ.ජී. ගුණසිංහ මයා | 2022.11.08 | 18835 | 10800.00 |
| 03 | ඩබ්.එච්.එම්. ප්‍රදීප් කුමාර මයා | 2022.11.23 | 18918 | 11880.00 |
| 04 | සී.එන්. ජයසිංහ මයා | 2022.11.25 | 18927 | 10800.00 |
| 05 | සී.එන්. ජයසිංහ මයා | 2022.11.25 | 18928 | 5400.00 |
| 06 | හැටුවගේ ධර්මපාල මයා | 2022.11.25 | 18929 | 16200.00 |
| 07 | සී.එන්. ජයසිංහ මයා | 2022.11.29 | 18947 | 5400.00 |
| | එකතුව | | | 83740.00 |

## 2022 නොවැම්බර් මාසයේ සභාව සතු වාහන වල ආදායම හා වියදම

| අනු අංකය | වාහනයේ නම | ආදායම රු. | වියදම රු. |
|---|---|---|---|
| 01 | ගලි බවුසරය | 48500.00 | 145340.00 |
| 02 | බැකෝලෝඩරය | 83740.00 | 478750.00 |
| | එකතුව | 132240.00 | 624090.00 |

## 2022 දෙසැම්බර් මාසයේ ගලි බවුසරයේ ආදායම

| අනු අංකය | නම | දිනය | ලදුපත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 01 | එස්.එම්.සී. දමයන්ති මිය | 2022.12.02 | 18972 | 9700.00 |
| 02 | වී.ඩබ්. රූපිකා මිය | 2022.12.08 | 18975 | 9700.00 |
| 03 | රංජි මයා | 2022.12.05 | 18976 | 9700.00 |
| 04 | වයි.සී.එස්. බණ්ඩාර මයා | 2022.12.06 | 18991 | 29640.00 |
| 05 | ඩබ්.කාන්තිලතා මිය | 2022.12.08 | 18994 | 9700.00 |
| 06 | සමන් කුලසිංහ මයා | 2022.12.09 | 19004 | 9700.00 |
| 07 | ජේ.ඒ. චමින්ද කුමාර.මයා | 2022.12.09 | 19005 | 9700.00 |
| 08 | චන්ද්‍රානී මිය | 2022.12.12 | 19013 | 9700.00 |
| 09 | එච්.ඒ. සනී මයා | 2022.12.13 | 19020 | 9700.00 |
| 10 | ජේ.ඒ. සුනිල් මයා | 2022.12.13 | 19021 | 9700.00 |
| 11 | සෝමසිරි මයා | 2022.12.15 | 19030 | 9700.00 |
| 12 | එච්.ජී.ජී.ඒ. මංජුල මයා | 2022.12.15 | 19034 | 9700.00 |
| 13 | ඒ.පී. ප්‍රියංක මයා | 2022.12.18 | 19054 | 9700.00 |
| 14 | ඩබ්.ඒ. දයානන්ද මයා | 2022.12.20 | 19076 | 9700.00 |
| 15 | ඩී. නන්දසේන මයා | 2022.12.29 | 19171 | 9700.00 |
| 16 | ජයන්ත රාජපක්ෂ මයා | 2022.12.30 | 19190 | 15060.00 |
| | එකතුව | | | [illegible] |

CamScanner

| අනු අංකය | නම | දිනය | ලදුපත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 01 | නන්දපාල ගුණරත්න මයා | 2022.12.01 | 18964 | 5400.00 |
| 02 | එස්.කේ. ධම්මික මයා | 2022.12.15 | 19033 | 20000.00 |
| 03 | ඩී.ඩබ්. තුෂාර මයා | 2022.12.20 | 19068 | 16200.00 |
| 04 | එස්.කේ. ධම්මික මයා | 2022.12.21 | 19078 | 28000.00 |
| | එකතුව | | | 69600.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී. ප්‍රදීප් නිශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

7.3. 2022.12.05 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

7.3.1. ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා විසින් 202212.05 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා සම්මත විය යුතු යයි යෝජනා කරන ලදී.

ප්‍රසම්පාදන තීරණ අංක :- 2022/20/01

හම්බන්තොට ප්‍රාදේශීය සභාව සතු LF – 3182 අංක දරණ ඩීමෝ බට්ටා රථයේ ඉදිරිපස ෂීට දෙක කුෂන් යොදා ෂීට කවර මසා හෙඩ්චුඩ් දෙකක් අලුතින් සකසා තට්ටුව කාපට් කර අලුත්වැඩියාවක් සිදු කිරීම හා NA– 5480 බස් රථයේ රියදුරු අසුන කුෂන් කර කවරය මසා සවි කිරීම සඳහා මිළ ගණන් කැඳවනු ලදුව ලැබී ඇති මිළ ගණන් පහත පරිදි වේ.

| අනු අංකය | අදාළ කාරණය | සවී කුෂන් වර්ක්ස් | රෝහණ කුෂන් වර්ක්ස් | කුෂන් වර්ක්ස් |
|---|---|---|---|---|
| 01 | LF – 3182 ඩීමෝ බට්ටා රථයේ ඉදිරිපස ෂීට දෙක කුෂන් යොදා ෂීට කවර මසා හෙඩ්බ්‍රික් දෙකක් අලුතින් සපයා නිම කිරීම හා තට්ටුව කාපට් කිරීම. | 29750.00 | 31750.00 | 43000.00 |
| 02 | NA – 5480 බස් රථය රියදුරු අසුන කුෂන් කර කවරය මසා සවි කිරීම. | 12500.00 | 14000.00 | 13500.00 |

ඉහතින් දක්වා ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සජී කුෂන් වර්ක්ස් නම් ආයතනයෙන් LF – 3182 අංක දරණ රථයේ හා NA – 5480 අංක දරණ රථයේ ඉහත කී අලුත්වැඩියාවන් සිදු කරවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී.

ප්‍රසම්පාදන තීරණ අංක :- 2022/20/02

හම්බන්තොට ප්‍රාදේශීය සභා කාර්යාල භූමිය වටා අලිවැට සැකසීම සඳහා අවශ්‍ය GI 2" පකිස්ථාන් හෙවි බට හා සිමෙන්ති කොට්ට 12 ක් මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදී. තවද මයුරපුර පොළෙහි නව ශාලාවේ ඉදිකර ඇති පිවිසුම් මාර්ග සඳහා යකඩින් අත්වැල් යොදා වර්ණ ගන්වා දෙන ලෙසට ආදායම් පරීක්ෂකතුමියගේ ඉල්ලීම් ලිපියට අදාලව තාක්ෂණ සේවා නිළධාරී මහතා විසින් ලබා දෙන ලද ද්‍රව්‍ය ලැයිස්තුවට අදාලව අවශ්‍ය ගොඩනැගිලි හා ඉදි කිරීම් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවනු ලදුව ලැබී ඇති මිළ ගණන් පහත පරිදි වේ.



CamScanner

| අනු අංකය | අදාල උපකරණ හා ද්‍රව්‍ය | සනුජි එන්ටප්‍රයිසස් මා හාඩ් වෙයාර් | කොඩිතුවක්කු හාඩ්වෙයාර් | රත්න හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | 2" GI පාකිස්ථාන් බට | 18300.00 | 18500.00 | 18450.00 |
| 02 | සිමෙන්ති | 2750.00 | 2800.00 | 2790.00 |
| 03 | නූල් 3" ඇන්කර් බෝල්ට් | 100.00 | 110.00 | 100.00 |
| 04 | 4 LT QD ප්‍රයිමර් කලු | 6000.00 | 6200.00 | 6050.00 |
| 05 | ILT QD ප්‍රයිමර් රතු | 1100.00 | 1100.00 | 1100.00 |
| 06 | 4 1/2 කටින් වීල් | 150.00 | 150.00 | 160.00 |
| 07 | තිනර් ලීටරය | 1750.00 | 1800.00 | 1900.00 |
| 08 | 10mm කොන්ක්‍රීට් විදින කටු | 350.00 | 350.00 | 365.00 |
| 09 | 10mm යකඩ විදින කටු | 1100.00 | 1100.00 | 1200.00 |
| 10 | 12g වෙල්ඩින් කූරු | 2500.00 | 2650.00 | 2550.00 |
| 11 | 2x2 650x 50 කල්බාර් | 12500.00 | 12590.00 | 12600.00 |
| 12 | 1'x6mm පට්ටම | 2900.00 | 2950.00 | 2975.00 |
| 13 | 12mm වෙල්බෝන් දඟර කම්බි | 2400.00 | 2450.00 | 2490.00 |
| 14 | 4 1/2 slon කටින් වීල් | 370.00 | 380.00 | 390.00 |
| 15 | 4 1/2 ග්‍රයින්ඩින්ග් වීල් | 500.00 | 510.00 | 520.00 |
| 16 | 1/4 කටු විදින කටු | 500.00 | 510.00 | 520.00 |

ඉහතින් දක්වා ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති සනුජි එන්ටප්‍රයිසස් නම් ආයතනයෙන් ඉහත සඳහන් කාරණයට අවශ්‍ය කරන්නාවූ උපකරණ හා ද්‍රව්‍ය මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී.

<u>ප්‍රසම්පාදන තීරණ අංක :- 2022/20/03</u>

හම්බන්තොට ප්‍රාදේශීය සභා කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් දමා අලෙවි කිරීම සඳහා අවශ්‍ය බැග් මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවනු ලදුව ලැබී ඇති මිළ ගණන් පහත පරිදි වේ.

| අනු අංකය | අවශ්‍ය කාරණය | මීගස්දෙනිය ට්‍රේඩර්ස් | පලිහක්කාර ට්‍රේඩර්ස් | සනුජි එන්ටප්‍රයිසස් |
|---|---|---|---|---|
| 01 | 50 Kg - 01 | 85.00 | 90.00 | 92.00 |
| 02 | 25 Kg - 01 | 60.00 | 60.00 | 63.00 |
| 03 | ගෝනි නූල් 1Kg | 1400.00 | 1450.00 | 1460.00 |
| 04 | ගෝනි කටු - 01 | 50.00 | 52.00 | 53.00 |

ඉහතින් දක්වා ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති මීගස්දෙණිය ට්‍රේඩර්ස් නම් ආයතනයෙන් කොම්පෝස්ට් බහාලීමට අවශ්‍ය කරන්නාවූ බැග් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී.

ප්‍රසම්පාදන තීරණ අංක :- 2022/20/04

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක මහත්මියට 2022 වසරට නිල ඇඳුම ( රාජ්‍ය සේවකයින්ට නිල ඇඳුම් හිමි චක්‍රලේඛය පරිදි) ලබා දීම සහා මිළ ගණන් කැඳවනු ලදුව ලැබී ඇති මිළ ගණන් පහත පරිදි වේ.

| අනු අංකය | අදාල කාරණය | මංජුල ටෙක්ස්ටයිල්ස් | ශාන්ති ට්‍රේඩ් සෙන්ටර් | සුරංග ටෙලර්ස් |
|---|---|---|---|---|
| 01 | සුදු සාරි - 01 | 4900.00 | 4000.00 | 4950.00 |
| 02 | සුදු ලිනන් යාර - 01 | 200.00 | 220.00 | 225.00 |

ඉහතින් දක්වා ඇති මිල ගණන් අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ශාන්ති ට්‍රේඩ් සෙන්ටර් නම් ආයතනයෙන් ආදායම් පරීක්ෂකතුමියට අවශ්‍ය හිල ඇණි කට්ටල ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී.

ප්‍රසම්පාදන තීරණ අංක :- 2022/20/05

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ලිපි ශීර්ෂ කොල 3000 ක් මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබූ ලැබී ඇති මිල ගණන් පහත පරිදි වේ.


| අනු අංකය | අදාල කාරණය | සිරිසර ප්‍රින්ටර්ස් | සිරිවර්ධන ඇඩ්වර්ටයිසින් | ප්‍රියන් ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | ලිපි ශීර්ෂ කොල Ax4 මුද්‍රණය කරවා ගැනීම (80gsm) | 8.50 | 8.75 | 9.00 |


ඉහතින් දක්වා ඇති මිල ගණන් අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සිරිසර ප්‍රින්ටර්ස් නම් ආයතනයෙන් කාර්යාලයට අවශ්‍ය කරන්නාවූ ලිපි ශීර්ෂ කොල මුද්‍රණය කරවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.කේ. උපුල් සංජය මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

7.4 හම්බන්තොට ප්‍රාදේශීය ගරු සභාපතිතුමා විසින් හම්බන්තොට ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ වසර 05ක ආදායම් ප්‍රගතිය ඇතුළත් වාර්තාව සභාගත කරන ලදී.

7.4.1 ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා විසින් හම්බන්තොට ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ වසර 05ක ආදායම් ප්‍රගතිය ඇතුළත් වාර්තාව සභා සම්මත විය යුතු යයි යෝජනා කරන ලදී.






| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| පොහොර අලෙවිය | 60,810 | 124,100 | 112,440 | 130,871 | 205,220 |
| ප්‍රතිභාවිත ද්‍රව්‍ය අලෙවිය | 756,456 | 646,278 | 359,025 | 361,541 | 319,270 |
| කසළ ගාස්තු | 1,857,775 | 3,787,386 | 3,554,000 | 3,584,480 | 3,511,550 |

7.5 කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ 2022 දෙසැම්බර් මස වියදම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභා: කරන ලදී.

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ 2022 දෙසැම්බර් මාසයේ ආදායම සහ වියදම

ආදායම් ලැබීම ( රුපියල් )

| | | |
|---|---|---|
| පොහොර අලෙවි කිරීම | - | 62,850.00 |
| හැන්ග්‍රිලා හෝටලය | - | 282,200.00 |
| කුරුලු උයන කසළ ගාස්තු | - | 20,000.00 |
| දුම්දූ ලුණු කසළ ගාස්තු | - | 5,000.00 |
| ප්‍රතිභාවිත අලෙවිය | - | 5205.00 |
| මුලු ආදායම | - | 375,255.00 |

වියදම් පියවීම ( රුපියල් )

කොම්පෝස්ට් ආයතනයට අනුයුක්ත සේවකයින්ගේ වැටුප් හා අතිකාල දීමනා - 226,700.91

කම්පැක්ටරයේ රියදුරු සහ සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනාගේ වැටුප්, අතිකාල දීමනා සහ ගමන් වියදම් - රු.133,331.00

| | | |
|---|---|---|
| කම්පැක්ටරය සඳහා ඉන්ධන | - | 137,400.00 |
| ජල වියදම | - | 8,927.00 |
| විදුලි වියදම | - | 3,120.52 |
| දුරකතන වියදම | - | 1,051.00 |
| සබන් කැට | - | 600.00 |

(18)

| | | |
|---|---|---|
| පොහොර කවර | - | 30,600.00 |
| සංග්‍රහ වියදම් | - | 2,720.00 |
| CR පොත් 01 | - | 400.00 |
| මුලු වියදම | - | 544,850.43 |
| ශුද්ධ අලාභය | - | (169,595.43) |

<u>ගරු මන්ත්‍රී එස්.ඒ. නිහාල් ශාන්ත මයා</u>

කොම්පෝස්ට් ආයතනයේ ප්‍රතිභාවිත ද්‍රව්‍ය විකිණීමේදී ඒ ඒ මාසයන්හි ලැබුණු ද්‍රව්‍ය ප්‍රමාණය හා ඒ ඒ මාසයන්හි විකුණන ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් ප්‍රමාණය දක්වා කි.ග්‍රෑ 01 ක් විකුණන ලද මුදල ඇතුළත්ව සෑම මසකම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලද අතර, කොම්පෝස්ට් ආයතනයට ලැබෙන යකඩ විකුණනු ලබන මිළ ගණන් සම්බන්ධයෙන් ප්‍රශ්ණ කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

කොම්පොස්ට් ආයතනයේ ප්‍රතිභාවිත ද්‍රව්‍ය විකිණීම සම්බන්ධ තොරතුරු සෑම මසකම පරිසර කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, ප්‍රතිභාවිත ද්‍රව්‍ය එකතු කිරීමේදී යකඩ නොලැබෙන අතර, ෂැංග්‍රිලා ආයතනය ඉදිකර අවසන් වීමේදී එකතු වී තිබූ අපද්‍රව්‍ය මීට වසර 03 කට පෙර හම්බන්තොට ප්‍රාදේශීය සභාවට ලබාදුන් අතර, එහිදී ගනු ලැබූ අපද්‍රව්‍ය අතර, සුළු ප්‍රමාණයක් අබලි යකඩ අන්තර්ගතවී තිබූ අතර, ඒවාද තෝරා නිසි ක්‍රමවේදයකට අනුව මිළ ගණන් කැඳවා ලබාදුන් බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු උපසභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

සභාව කාරක සභාවක් බවට පත්කර කොම්පෝස්ට් ආයතනය භාර විෂය නිළධාරිනිය සභාවට කැඳවන ලද අතර, කොම්පෝස්ට් ආයතනයට ලැබෙන ප්‍රතිභාවිත ද්‍රව්‍ය සම්බන්ධයෙන් හා යකඩ විකිණීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

නැවත කාරක සභාව මහා සභාව බවට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු උපසභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ. නිහාල් ශාන්ත මයා</u>

කොම්පෝස්ට් ආයතනයට ලැබෙන ප්‍රතිභාවිත ද්‍රව්‍ය වර්ග කර ඒ ඒ මාසවල ලැබෙන ප්‍රතිභාවිත ද්‍රව්‍ය ප්‍රමාණයත්, ඒවා විකුණනු ලබන මිළ ගණන් සෑම මසකම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට වාර්තා ඉදිරිපත් කරන ලෙසත්, කොම්පෝස්ට් කොපමණ විකුණනු ලබන්නේද, යකඩ කි.ග්‍රෑ 01 ක් විකුණනු ලබන මුදල පිළිබඳව දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලද අතර, ප්‍රතිභාවිත ද්‍රව්‍ය අතරට යකඩ නොලැබෙන බව විෂය නිළධාරිනිය පවසා සිටියත් යකඩ ලැබෙන බවු ඔප්පු කර පෙන්වීමට කටයුතු

කරන බවත් ප්‍රකාශ කරන ලදී. තවද ෂැංග්‍රිලා ආයතනයෙන් ලැබුණු අබිලි යකඩ මිළ ගණන් ක...
විකිණීම සිදුකලේද යන්න ප්‍රශ්ණ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඩබ්. සුමිත් කුමාර මහතා</u>

පරිසර කමිටුව 03 මාසයේ කැදවූ පසු 12 වෙනි මාසයේ කැඳවා ඇති අතර, පරිසර කමිටුව සෑම මස... පවත්වා නොමැති බවත්, කොම්පෝස්ට් ආයතයේ ප්‍රතිභාවිත ද්‍රව්‍ය යටතේ ලැබෙන යකඩ මෙ... ප්‍රදේශයේ අයෙකුට ලබාදීම් සම්බන්ධයෙන් දැනට සභාවේ ප්‍රකාශ වන අතර, ඒ පිළිබඳව විමසන ලදී.

<u>ගරු උප සභාපති ඩබ්.එච්.එම්. රුවන් කුමාර මහතා</u>

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ පරිසර කමිටුව හා පුස්තකාල කමිටුව සභාව පවතින සෑම දිනකම සභ... අවසන් වූ පසු මෙම ස්ථානයේදීම පවත්වනු ලබන අතර, පොලිසිය, මහජන පරික්ෂක නිලධාරීන් ... අනෙකුත් පරිසර කමිටුවට සම්බන්ධ කළයුතු නිළධාරීන් සම්බන්ධ කරගෙන පසුගිය මාසයේද පරිස... කමිටුව පවත්වා ඇති අතර, ලැබෙන පැමිණිළි අනුව අවශ්‍ය අවස්ථා වලදී පමණක් පරිසර කමිටු... පවත්වනු ලබන බව ප්‍රකාශ කරන ලදී. අප විසින් කොම්පෝස්ට් ආයතනය නිරික්ෂණය කළ අතර, දැනට පවතින තත්වය අනුව මෙම අපද්‍රව්‍ය විකිණීම සම්බන්ධයෙන්ද ගැටළු පැන නැගී ඇති බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ආර්. දිසානායක සිරිපාල මහතා</u>

පරිසර කමිටුවේ මමද සිටින අතර, සෑම මසකම පරිසර කමිටුව පැවැත්වීමට කටයුතු කරන බවත්, නමුත් ... කමිටුවට ඉදිරිපත් කිරීමට කරුණු නොමැතිවීම හේතුවෙන් පසුගිය පරිසර රැස්වීම පැවැත්වීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලද අතර, කොම්පෝස්ට් ආයතනයේ පොහොර ප්‍රතිභාවිත ද්‍රව්‍ය විකිණීම සම්බන්ධ ... තොරතුරු සෑම මසකම පරිසර කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, ප්‍රතිභාවිත ද්‍රව්‍ය එකතු කිරීමේදී යකඩ නොලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

කොම්පෝස්ට් ආයතනයේ නොදිරන කසල සමඟ ලැබෙන ප්‍රතිභාවිත කළහැකි ද්‍රව්‍ය පරිසරයට හානි නොවන ආකාරයට වෙන්කර ඒවා සුදුසු පරිදි අපහරණය කිරීමෙ කටයුතු සිදුකිරීමේදී හැකි සෑම දෙයක්ම ප්‍රතිචක්‍රීකරණය සදහා යොමුකිරීමට කටයුතු කරන බවත්, වෙළඳපොළේ පවතින මිලට ප්‍රාදේශීය ගැණුම්කරුවන් සොයා ඒ අවස්ථාවේ පවතින මිළට අළෙවි කිරීමට කටයුතු කරන බවත්, ප්‍රතිභාවිත ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ආදායම මාසිකව සභාවට ඉදිරිපත් කරන බවත්, කොම්පෝස්ට් ආයතනයට දෛනිකව කසල සමඟ යකඩ නොලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. ෂැංග්‍රිලා ආයතනයේ විශේෂ කසල තොගයක් සමඟ ලැබුණු අබිලි යකඩ ඒ අවස්ථාවේ පවතින මිලට මිළ ගණන් කැඳවා අළෙවි කළ බවත්, මාසිකව විකුණනු අබිලි ද්‍රව්‍ය විකුණනු ලබන මිළ ගණන් පිළිබඳ වාර්තා විෂය නිළධාරිණිය විසින් පවත්වාගෙන යන බවත්, මාසික ආදායම් වියදම් වාර්තාවන් මාසික සභාවට ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලද අතර, කොම්පෝස්ට් ආයතනයට දෛනිකව යකඩ නොලැබෙන අතර, කොම්පෝස්ට් ආයතනයේ යකඩ විකිණීම සම්බන්ධයෙන් ගැටළු පවතින බව ගරු මන්ත්‍රී එස්.ජී. නිහාල් ශාන්ත මහතා විසින් තරයේ ප්‍රකාශ කරන සිටින අතර, කොම්පෝස්ට් ආයතනයේ යකඩ විකුණන්නේ නම් එය ඔප්පු කර පෙන්වන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

7.5 2022 දෙසැම්බර් මස ප්‍රාස 07 වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.



CamScanner

7.6.1 ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා 2022 දෙසැම්බර් මස ප්‍රාස 07 වාර්තාව සභා සම්මත විය යුතු යයි යෝජනා කරන ලදී.

| ප්‍රා.ස. 07 - 2022 දෙසැම්බර් | | | | | | |
|---|---|---|---|---|---|---|
| .. | 2022.12.01 දිනට ඉ/ගෙනා ශේෂය | 2022 දෙසැම්බර් බිල්කිරීම | ප්‍රමාද ගාස්තු | එකතුව | 2022 දෙසැම්බර් අයවීම | ඉ/ගෙනා ශේෂය |
| වරිපනම් හිඟ | 718904.77 | 0.00 | | 718904.77 | 19135.55 | 699769.22 |
| වරිපනම් පවත්නා | 203659.12 | 0.00 | | 203659.12 | 56223.66 | 147435.46 |
| අක්කර බදු හිඟ | 5409.25 | 0.00 | - | 5409.25 | 0.00 | 5409.25 |
| අක්කර බදු පවත්නා | 6750.00 | 0.00 | - | 6750.00 | 0.00 | 6750.00 |
| බලපත්‍ර ගාස්තු හිඟ | 5000.00 | 0.00 | - | 5000.00 | 2000.00 | 3000.00 |
| බලපත්‍ර ගාස්තු පවත්නා | 28000.00 | 0.00 | - | 28000.00 | 6000.00 | 22000.00 |
| පාපැදි බලපත්‍ර ගාස්තු පවත්නා | 0.00 | 0.00 | - | 0.00 | 0.00 | 0.00 |
| ව්‍යාපාර බදු හිඟ | 29900.00 | 0.00 | - | 29900.00 | 1200.00 | 28700.00 |
| ව්‍යාපාර බදු පවත්නා | 59400.00 | 0.00 | - | 59400.00 | 10800.00 | 48600.00 |
| කර්මාන්ත බදු හිඟ | 6000.00 | 0.00 | - | 6000.00 | 1000.00 | 5000.00 |
| කර්මාන්ත බදු පවත්නා | 10500.00 | 0.00 | - | 10500.00 | 1500.00 | 9000.00 |
| කඩ කාමර කුලී හිඟ | 0.00 | 0.00 | - | 0.00 | 0.00 | 0.00 |
| කඩ කාමර කුලී හිඟ දඩ | 0.00 | 0.00 | - | 0.00 | 0.00 | 0.00 |
| කඩ කාමර කුලී පවත්නා | 11500.00 | 5700.00 | - | 17200.00 | 9900.00 | 7300.00 |
| කඩ කාමර කුලී දඩ | 4624.00 | 0.00 | 0.00 | 4624.00 | 2426.00 | 2198.00 |
| දැන්වීම් පුවරු ගාස්තු හිඟ | 14000.00 | 0.00 | - | 14000.00 | 0.00 | 14000.00 |
| දැන්වීම් පුවරු ගාස්තු පවත්නා | 350300.00 | 0.00 | - | 350300.00 | 133100.00 | 217200.00 |
| පොළ බදු හිඟ | 0.00 | 0.00 | - | 0.00 | 0.00 | 0.00 |
| පොළ බදු පවත්නා | 2352068.00 | 1469725.00 | - | 3821793.00 | 3818793.00 | 3000.00 |
| | **3806015.14** | **1475425.00** | **0.00** | **5281440.14** | **4062078.21** | **1219361.93** |

එම යෝජනාව ගරු මන්ත්‍රී එච්.එස් ප්‍රදීප් නිශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

8.1 <u>ගරු සභාපති ගාමිණී සමරගුණරත්න මහතා</u>

8.1.1 අද දින පෞද්ගලික අවශ්‍යතාවයක් හේතුවෙන් මාසික සභාවට පැමිණීමට නොහැකි බව ගරු මන්ත්‍රී ජේ.ඒ. කසුන් තිලජන මහතා දැනුම් දී ඇති බැවින් නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ. උපුල් සංජය මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.



CamScanner

ගරු සභාපති ගාමිණී සමරතුංගරත්න මහතා

8.1.2 අද දින පෙරේදාතින් අවසානයක් නොවූවෙන් මාසික සභාවට ඇමතීමට නොහැකි බව ... ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රදාස ප්‍රනාන්දු මහතා දැනුම් දී ඇති බැවින් නිවාඩු අනුමත කිරීම ... බව යෝජනා කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්. සුමිත් කුමාර මහතා විසින් එම යෝජනා ... ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකත්වයෙන් සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති ගාමිණී සමරතුංගරත්න මහතා

ඒ අනුව අද දින මාසික සභා රැස්වීමේ කටයුතු මෙතෙක් සාර්ථකව සිදු කර ගැනීම සඳහා සහාය වූ ... උපසභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය සහ නිලධාරීතුමිය ... සියලු දෙනාටම ස්තූතිය පුද කරමින් සියලු දෙනාට සුබ දවසක්, සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මීළඟ සභා රැස්වීම 2023.03.07 දින පැවැත්වීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමින් රැස්වීමේ කටයුතු ... 1.30 ට අවසන් කරන ලදී.

ගාමිණී සමරතුංගරත්න
සභාපති
හම්බන්තොට ප්‍රාදේශීය සභාව

ගාමිණී සමරතුංගරත්න
සභාපති
හම්බන්තොට ප්‍රාදේශීය සභාව

CamScanner